# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2012/2 - 2017 මාර්තු මස 27 වැනි සඳුදා - 2017.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත**

2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන් වරට සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 22 වන වගන්තියේ 14 වැනි උප වගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, කළ්‍යානි දහනායක වන මම, මෙම නිවේදනය මගින් ලියාපදිංචි නොවූ තැනැත්තන් වෙතින් කරන ලද මිලදී ගැනීම් මත සහ ආරම්භක තොගය මත යෙදවුම් සේ සැලකෙන බදු බැර ඉල්ලීමේ කාර්යය සඳහා 2016 මැයි 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි තොග වෙළෙඳාම සහ සිල්ලර වෙළෙඳාම මත එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි තැනැත්තන් විසින් පවත්වාගෙන යා යුතු සහ අනුගමනය කළ යුතු ලේඛන මෙහි පහත උපලේඛනයේ දැක්වෙන පරිදි නියම කරමි.

කළ්‍යානි දහනායක,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2017 මාර්තු මස 23 වැනි දින,
කොළඹ 02.

උපලේඛනය

1. **තොග මත යෙදවුම් සේ සැලකෙන බදු**

(i) තොග හෝ සිල්ලර වෙළෙන්දකු ලෙස එකතු කළ අගය මත බද්ද (VAT) සඳහා ලියාපදිංචි යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක්, එම ලියාපදිංචිය 2016.05.02 දින සිට 2016.12.31 වන දින දක්වා කාලසීමාව තුළ ලබාගෙන ඇත්නම් පහත නියම කර ඇති කොන්දේසිවලට යටත්ව ලියාපදිංචි දිනට පවතින බද්දට යටත් තොග මත යෙදවුම් සේ සැලකෙන බද්දක් ඉල්ලා සිටීමට ඉඩ දෙනු ලැබේ.

(ii) එකතු කළ අගය මත බද්දට යටත් තොගය මත යෙදවුම් සේ සැලකෙන බදු ප්‍රමාණය පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව තථ්‍ය ගණුදෙනු බර තැබූ සාමාන්‍ය දින සහ එක් එක් කාලපරිච්ඡේදයට අදාළ උචිත බදු ඛණ්ඩය II/III හෝ 15/115 මත පදනම්ව ආගණනය කළ යුතුය.

| කාලසීමාව | අදාළ එ. අ. බ. බණ්ඩය (*F*) | දින ගණන | කාලසීමාව සඳහා ආරෝපණය කළ හැකි එ. අ. බ. යටත් තොගය | | එ. අ. බ. යටත් තොග මත යෙදවුම් සේ සැලකෙන එ. අ. බ. (*V*) = *F* x *S* |
|---|---|---|---|---|---|
| | | | ආගණනය | එ. අ. බ. යටත් තොගයේ වටිනාකම (*S*) | |
| | | | තොග අගයන්හි වෙනස (විචල්‍යය) X දින බර තැබීම | | |
| 31.03.2016 | 11/111 | – | – | **B** | x xxxx |
| 01.04.2016 – 01.05.2016 | 11/111 | 31 | (A – B) x 31/Y | P | x xxxx |
| 02.05.2016 – 11.07.2016 | 15/115 | 71 | (A – B) x 71/Y | Q | x xxxx |
| 12.07.2016 – 31.10.2016 | 11/111 | 112 | (A – B) x 112/Y | R | x xxxx |
| 01.11.2016 ලියාපදිංචි දිනය | 15/115 | X | (A – B) x X/Y | S | x xxxx |
| එකතුව | | **Y** | | **A** | x xxxx |

- A - එ. අ. බද්ද සඳහා ලියාපදිංචි දිනට එකතු කළ අගය මත බද්දට යටත් තොගය.
- B - 2016.03.31 වන දිනට ශේෂපත්‍රයට අනුව එකතු කළ අගය මත බද්දට යටත් තොගය.
- ලියාපදිංචි දින සහ 2016.03.31 වන දිනට ශේෂපත්‍රය අතර එකතු කළ අගය මත බද්දට යටත් තොගයේ වෙනස (A - B) = P + Q + R + S වේ.
- එකතු කළ අගය මත බද්දට යටත් තොගයේ වෙනස්කම් (විචල්‍යයන්) බර තැබූ සාමාන්‍ය දින මත පදනම්ව කාලසීමාව තුළ බෙදා දෙනු ලැබේ.
- එකතු කළ අගය මත බද්දට යටත් තොගය මත යෙදවුම් සේ සැලකෙන එකතු කළ අගය මත බදු, බර තැබූ සාමාන්‍ය දින සහ එක් එක් කාලසීමාවට අදාළ බදු බණ්ඩය මත පදනම්ව ආගණනය කරනු ලැබේ.

iii. එකතු කළ අගය මත බද්දට යටත් තොග, එකතු කළ අගය මත බද්දට යටත් නොවන තොග සහ එකතු කළ අගය මත බද්දට යටත් තොගය මත යෙදවුම් සේ සැලකෙන බදු මත සටහන් ලියාපදිංචි වූ දිනට ආරම්භක තොග ලෙස උපලේඛනයක් මගින් පවත්වාගෙන යා යුතුය. (ඇමුණුම් II ලියාපදිංචි දිනට තොගය සඳහා උපලේඛනය) ලියාපදිංචි දිනය 2016.05.02 සහ 2016.11.01 අතර දිනයක් වේ නම්, 2016.11.01 දිනට පවතින තොගය ආරම්භක තොගය වන අතර පහත විස්තර කර ඇති පරිදි තොගය ගණනය කළ යුතුය.

| | |
|---|---|
| ලියාපදිංචි දිනට තොගය | xxx |
| එකතු කළා | |
| එ. අ. බ. සඳහා ලියාපදිංචි නොවූ තැනැත්තන්ගෙන් කරන ලද එ. අ. බ. යටත් මිලදී ගැනීම් | xxx |
| අඩු කළා | |
| ලියාපදිංචි දින සිට, 2016.11.01 දක්වා තොගයෙන් විකුණන ලද අයිතම | xxx |

(I වන ඡේදයේ (ii) වන අයිතමයේ දක්වා ඇති වගුව පරිදි උචිත අනුප්‍රමාණය අදාළ කරගත යුතුය.)

iv. මෙම උපලේඛනය, එකතු කළ අගය මත බද්දට යටත් තොගය මත යෙදවුම් සේ සැලකෙන බදු පළමු වරට ඉල්ලුම් කරන අවස්ථාවේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත එක් වරක් පමණක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. උපලේඛනය උඩුගත කිරීම සඳහා බලයලත් තැනැත්තකු ලෙස විද්‍යුත් සේවය හරහා උපලේඛන / ලේඛන ඉදිරිපත් කිරීම සඳහා වන අන්තර් මුහුණත භාවිතා කිරීමෙන් සිදු කළ යුතුය.

**2. ලියාපදිංචි නොවූ තැනැත්තන් වෙතින් මිල දී ගැනීම් මත යෙදවුම් සේ සැලකෙන බදු**

I. 2016 මැයි මස 02 වන දින හෝ එදිනට පසුව තොග වෙළෙන්දෙකු ලෙස එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි නොවූ තැනැත්තන් වෙතින් මිලදී ගන්නා අවස්ථාවේ දී එකතු කළ අගය මත බදු සඳහා යටත් භාණ්ඩ මිලදී ගැනීම් මත යෙදවුම් සේ සැලකෙන බද්දක් ඉල්ලුම් කිරීම පහත නියම කර ඇති කොන්දේසි වලට යටත්ව ඉඩ දෙනු ලැබේ.

II. එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් එම සැපයුම්කරුවන් වෙතින් පහත සඳහන් ලිපි ලේඛන ලබාගෙන අවශ්‍ය වූ විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා සූදානමින් තබාගත යුතුය.

(අ) ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්.

(ආ) ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් (හිමිකරු හෝ ප්‍රමුඛ හවුල්කරු)

(ඇ) වාණිජ ඉන්වොයිසිය.

III. යෙදවුම් සේ සැලකෙන බදු, බද්දට යටත් යටත් භාණ්ඩ මිලදී ගැනීමේ පිරිවැය මත මිලදී ගන්නා අවස්ථාවේ දී අදාළ වන එකතු කළ අගය මත බදු අනුප්‍රමාණයේ බදු ඛණ්ඩය භාවිත කරමින් ආගණනය කල යුතුය.

IV. යෙදවුම් සේ සැලකෙන බදු පිළිබඳ සටහන් සහ ලියාපදිංචි නොවූ තැනැත්තන්ගෙන් මිලදී ගත් භාණ්ඩ පිළිබඳව අනෙකුත් අදාළ තොරතුරු මාසික පදනම මත උපලේඛනයක පවත්වාගෙන යා යුතුය. (ඇමුණුම III) [ලියාපදිංචි නොවූ තැනැත්තන් වෙතින් මිලදී ගන්නා භාණ්ඩ මත යෙදවුම් සේ සැලකෙන බදු බැර සඳහා උපලේඛනය] එකතු කළ අගය මත බදු වාර්තාව කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමේ දී, එම තොරතුරු මත පදනම්ව පිළියෙල කරනු ලබන 05 වන උපලේඛනය පමණක් (ඇමුණුම 1) [ලියාපදිංචි නොවූ තැනැත්තන් වෙතින් මිලදී ගන්නා වූ භාණ්ඩ මත යෙදවුම් සේ සැලකෙන බදු බැර සඳහා උපලේඛනය] ඉදිරිපත් කළ යුතුය.

**3. යෙදවුම් සේ සැලකෙන බදු බැර සඳහා ඉල්ලුම් කිරීම**

එකතු කළ අගය මත බද්දට යටත් ආරම්භක තොගයට අදාළව සහ පළමු උපලේඛනයේ II වන කොටසේ සඳහන් නොවන අයිතමයන් මිලදී ගැනීමේ පිරිවැය මත යෙදවුම් සේ සැලකෙන බදු බැර සඳහා පහත සඳහන් සීමාවන්ට යටත්ව ඉල්ලුම් කළ හැකිය.

(අ) ඉහත සඳහන් බදු බැර, මෙම උපලේඛනයේ 1 වන හා 2 වන ඡේදයේ සඳහන් තැනැත්තන් සඳහා අදාළ වන අතර, එම තැනැත්තන් විසින්, තොග සහ සිල්ලර වෙළඳාමට අදාළ සැපයුම් අගය එකතු කළ අගය මත බදු වාර්තාවේ B කොටුවෙහි සහ අදාළ බද්ද 2 වන කොටුවෙහි ඇතුළත් කළ යුතුය.

(ආ) එවැනි තැනැත්තන් B කොටුවෙහි ඇතුළත් කරන ලද බදු ඉන්වොයිස් සහ බදු ඇතුළත් ඉන්වොයිස් මත කරන ලද සැපයුම් පිළිබඳව උපලේඛන 1 (නිමැවුම් උපලේඛන) ඉදිරිපත් කළ යුතුය.

(ඇ) එම තැනැත්තන් විසින් මෙම *ගැසට් නිවේදනයේ* නියම කර ඇති උපලේඛන පවත්වාගෙන යා යුතුය.

(ඈ) 05 වන උපලේඛනයේ සඳහන් ලියාපදිංචි නොවන තැනැත්තන් වෙතින් මිලදී ගන්නා වූ බද්දට යටත් සහ යටත් නොවන භාණ්ඩ අගය 14 වන කොටුවේ ඇතුළත් කරනු ලැබිය යුතුය.

(ඉ) ඉල්ලුම් කළ හැකි යෙදවුම් සේ සැලකෙන බදු බැර එ. අ. බ. වාර්තාවේ R 3 කොටුවෙහි ඇතුළත් කරනු ලැබිය යුතු අතර එම අගය පහත සඳහන් ආකාරයෙන් ලබාගත යුතුය.

**(I) ආරම්භක තොග මත යෙදවුම් සේ සැලකෙන බදු බැර**

(i) ලියාපදිංචි දිනට නොවිකුණුනු බද්දට යටත් භාණ්ඩ තොග මත 05A උපලේඛනයෙහි ආගණිත පළමු වතාවට ඉල්ලුම් කරනු ලබන යෙදවුම් සේ සැලකෙන බදු බැර, එකතු කළ අගය මත බදු වාර්තාවේ R3A කොටුවෙහි ඇතුළත් කළ යුතුය. ලියාපදිංචි දිනය 2016.05.02 සහ 2016.11.01 අතර දිනයක් වේ නම්, ඉහත 1 වන ඡේදයේ iii අයිතමයේ විස්තර කර ඇති පරිදි 2016.11.01 දිනට පවතින තොගය ආරම්භක තොගය වේ.

(ii) බදු අයකළ හැකි කාල සීමාව තුළ, පහත 4 වන ඡේදයෙහි සඳහන් සීමාවන්ට යටත්ව ඉල්ලුම් කරනු ලබන යෙදවුම්සේ සැලකෙන බදු බැර R3B වන කොටුවෙහි ඇතුළත් කළ යුතුය.

(iii) එම බදු අයකළ හැකි කාලසීමාව තුළ ඉල්ලුම් කළ නොහැකි ආරම්භක තොගය මත යෙදවුම් සේ සැලකෙන බදු බැර වේ නම්, ඉදිරියට ගෙන යනු ලබන යෙදවුම් සේ සැලකෙන බදු බැර ලෙස R3C කොටුවෙහි ඇතුළත් කළ යුතුය. එසේම, මෙම අගය ඊට පසු ආසන්නම බදු අයකළ හැකි කාලසීමාවේ ආරම්භක ශේෂය විය යුතු අතර, එය එම බදු අයකළ හැකි කාලසීමාව සඳහා එකතු කළ අගය මත බදු වාර්තාවේ R3A කොටුවෙහි ඇතුළත් කළ යුතුය.

(iv) ආරම්භක තොගයේ අයිතමයන්ට අදාළ එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන පරිදි ඉඩදිය නොහැකි එකතු කළ අගය මත බදු යෙදවුම්, ආරම්භක තොගය මත යෙදවුම් සේ සැලකෙන බදු බැර ඉල්ලුම් කිරීමේ දී සැලකිල්ලට නොගත යුතුය.

**(II) එ. අ. බ. ලියාපදිංචි නොවූ තැනැත්තන් වෙතින් බදු අයකළ හැකි කාල සීමාව තුළ කරනු ලබන මිලදී ගැනීම් මත යෙදවුම් සේ සැලකෙන බදු බැර**

(i) ලියාපදිංචි නොවූ තැනැත්තන් වෙතින් බදු අයකළ හැකි කාලය තුළ කරන ලද එකතු කළ අගය මත බදු අයකළ හැකි මිලදී ගැනීම් අගය මත 05 වන උපලේඛනයේ ආගණිත යෙදවුම් සේ සැලකෙන බදු බැර එකතු කළ අගය මත බදු වාර්තාවේ R3E කොටුවෙහි ඇතුළත් කළ යුතුය. පහත (v) අයිතමයෙහි සඳහන් ඉඩදිය නොහැකි යෙදවුම් බද්දක් වේ නම් R3E හි අගය යෙදවුම් සේ සැලකෙන එකතු කළ අගය මත බද්දේ සහ ඉඩදිය නොහැකි යෙදවුම් සේ සැලකෙන එ. අ. බද්දේ ශුද්ධ අගය විය යුතුය.

(ii) ලියාපදිංචි දිනය 2016.05.02 සහ 2016.11.01 අතර දිනයක් වේ නම්, ඉහත 1 වන ඡේදයේ iii අයිතමයේ විස්තර කර ඇති පරිදි, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි නොවූ තැනැත්තන්ගෙන් කරන ලද එකතු කළ අගය මත බද්දට යටත් මිලදී ගැනීම් ලියාපදිංචි වූ දිනට තොගයට එකතු කර ඊට පසු විකුණන ලද අයිතමයන් හි අගය එයින් අඩු කළ යුතුය.

(iii) බදු අයකළ හැකි කාලසීමාව තුළ පහත 4 වන ඡේදයේ සඳහන් සීමාවන්ට යටත්ව ඉල්ලුම් කළහැකි යෙදවුම් සේ සැලකෙන බදු බැර R3F කොටුවෙහි ඇතුළත් කළ යුතුය.

(iv) බදු අය කළ හැකි කාල සීමාවෙහි ඇති යෙදවුම් සේ සැලකෙන බදු බැර සඳහා බදු අය කළ හැකි කාලසීමාව තුළ ඉල්ලුම් කළ නොහැකි නම් එය ඉදිරියට ගෙන යන යෙදවුම්සේ සැලකෙන බදු බැර ලෙස R3G කොටුවෙහි ඇතුළත් කළ යුතුය. එසේම, මෙම අගය ඊට පසු ආසන්නම බදු අයකළ හැකි කාලසීමාවේ ආරම්භක ශේෂය වන අතර එය එම බදු අයකළ හැකි කාලසීමාවේ එකතු කළ අගය මත බදු වාර්තාවේ R3D කොටුවෙහි ඇතුළත් කළ යුතුය.

(v) එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන අනුව ඉඩදිය නොහැකි යෙදවුම්, බදු අයකළ හැකි කාලසීමාව තුළ මිලදී ගෙන ඇති අයිතමයන් සඳහා උපලේඛන 05 හි ප්‍රකාශ කළ යුතුය.

4. **යෙදවුම් සේ සැලකෙන බදු බැර ඉල්ලුම් කිරීමට අදාළ සීමාවන්**

i. R3 කොටුවෙහි යෙදවුම් සේ සැලකෙන බදු බැර පහත (ii) වන අයිතමයේ සඳහන් කොන්දේසි වලට යටත්ව R3B සහ R3F කොටුවෙහි යෙදවුම් සේ සැලකෙන බදු බැර එකතුවට සමාන විය යුතුය.

ii. තොග වෙළෙඳාම සහ සිල්ලර වෙළෙඳාමට අදාළව R3(R3B+R3F) කොටුවෙහි ඉල්ලුම් කරනු ලබන යෙදවුම් සේ සැලකෙන බදු බැර

- 2 කොටුවේ ප්‍රකාශිත නිමැවුම් බද්ද හෝ
- ශුද්ධ ගෙවිය යුතු එකතු කල අගය මත බද්දෙන් R, $R_1$ සහ $R_2$ කොටුවල ප්‍රකාශිත බදු බැර අඩු කළ පසු අගය (16-R-$R_1$-$R_2$) හෝ
- 2 වන කොටුවෙහි ප්‍රකාශිත නිමැවුම් බද්දෙන් තොග සහ සිල්ලර වෙළඳාමට අදාළව බදු ඉන්වොයිස් මත ඉල්ලා සිටින බදු බැර අඩු කරනු ලැබූ පසු අගයෙන් (2 කොටුව - 7 කොටුව)

අඩු අගයට සීමා විය යුතුය.

සටහන :

(අ) උපරිම සිල්ලර මිල යෙදවුම් සේ සැලකෙන එ.අ.බ. සඳහා ඉල්ලුම් කරනු ලබන භාණ්ඩ විකිණීම මත වැඩි කරනු ලැබිය නොහැකිය.

(ආ) යෙදවුම් සේ සැලකෙන එ.අ.බ. අනුව මිලදී ගැනුම් ගිණුමට සහ එ.අ.බ. පාලන ගිණුමට ගැලපුම් කළ යුතුය.

(ඇ) වෙළඳ ගිණුම සඳහා ගලපන ලද මිලදී ගැනුම් පිරිවැය සහ යෙදවුම් බදු සැසඳීමේ ප්‍රකාශයක් ආදායම් බදු වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතුය.

ඇමුණුම I

05 වන උපලේඛනය - ලියාපදිංචි නොවූ තැනැත්තන් ගෙන් මිලදී ගන්නා භාණ්ඩ මත යෙදවුම් සේ සැලකෙන එකතු කළ අගය මත බදු

(05 වන උපලේඛනය කොමසාරිස් ජනරාල් වෙත වාර්තා ඉදිරිපත් කිරීමේ දී භාවිතා කළ යුතුය)

| අනු. අංකය | ඉන්වොයිසි දිනය | ඉන්වොයිසි අංකය | සැපයුම් කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය | සැපයුම් කරුගේ BRC අංකය PSV අංකය | ආදායම් බදු ලිපිගොනු අංකය වේ නම් | සැපයුම් කරුගේ නම | එ.අ.බ. යටතේ බදු අයකළ හැකි කාල සීමාව තුළ කරන ලද මිලදී ගැනීම් පිරිවැය (A) (රු) | එ.අ.බ. යටතේ නොවන බදු අයකළ කාලසීමාව තුළ කරන ලද මිලදී ගැනීමේ පිරිවැය (B) (රු) | යෙදවුම් සේ සැලකෙන බදු එ. අ. බ. =Ax (බදුඅනුප්‍රමාණ/ 1+ බදුඅනුප්‍රමාණ) | ඉඩදිය නොහැකි යෙදවුම්සේ සැලකෙන එ. අ. බ. වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | | | |
| 2 | | | | | | | | | | |
| 3 | | | | | | | | | | |

ඇමුණුම II

**ලියාපදිංචි දිනට ආරම්භක තොගය මත යෙදවුම් සේ සැලකෙන එකතු කළ අගය මත බදු**

| අනු. අංකය | ඉන්වොයිසි දිනය | ඉන්වොයිසි අංකය | භාණ්ඩ විස්තරය | ලියාපදිංචි දිනට නොවිකිණුනු ඒකක මිළදී ගැනීම් පිරිවැය (ඉහත ඡේදයේ (I) (II) දී ඇති ආකෘති පත්‍රය අනුව එ.අ.බද්දට යටත් (A) (රු.) | ලියාපදිංචි දිනට නොවිකුණුණු ඒකක මිළදී ගැනීම් පිරිවැය එ. අ. බ. යටත් නොවන (B) (R) | යෙදවුම්සේ සැලකෙන එ. අ.බ. =A (බදුඅනුප්‍රමාණය/ 1+ බදුඅනුප්‍රමාණය) |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |

ඇමුණුම III

## බදු අයකළ හැකි කාලසීමාව තුළ කරන ලද මිලදී ගැනීම මත යෙදවුම් සේ සැලකෙන බදු පිළිබඳ උපලේඛනය

| අනු. අංකය | ඉන්වයිසි දිනය | ඉන්වයිස අංකය | සැපයුම් කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය | සැපයුම් කරුගේ BRC අංකය PSV අංකය | ආදායම් බදු ලිපි ගොනු අංකය වේ නම් | සැපයුම් කරුගේ නම | භාණ්ඩ විස්තර | ඒකක මිළ | ප්‍රමාණය | බදු අයකළ හැකි කාලසීමාව තුළ කරන ලද මිලදී ගැනීම් පිරිවැය, එ. අ. බද්දට යටත් (A) (රු.) | බදු අයකළ හැකි කාල සීමාව තුළ කරන ලද මිලදී ගැනීමේ පිරිවැය, එ.අ. බද්දට යටත් නොවන (B) (රු.) | යෙදවුම්සේ සැලකෙන එ.අ.බ. Ax (බදු ප්‍රමාණය/1 + බදු අනු ප්‍රමාණය) | ඉඩදිය නොහැකි යෙදවුම්සේ සැලකෙන එ. අ. බ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | | |
| 4 | | | | | | | | | | | | | |
| 5 | | | | | | | | | | | | | |
| 6 | | | | | | | | | | | | | |

04-219